## 2023-12-18 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. සබරගමුව පළාතේ ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ ගිවිසුම්ගත වීම

සබරගමුව පළාතේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන ගුරුවරුන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දී ඔවුන්ගේ භාෂා දැනුම හා ඉගැන්වීම් කුසලතා වර්ධනය කිරීමේ ධාරිතා සංවර්ධන වැඩසටහනක් බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ එක්ව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ ගුරුවරුන් 700 දෙනෙකු තෝරාගෙන කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය හා අනුබද්ධිත Teaching Knowledge Test (TKT) පාඨමාලාව මඟින් එම ගුරුවරුන්හට විධිමත් පුහුණුවක් ලබා දීමට අපේක්ෂා කරනු ලබයි. සබරගමු පළාත් සභාවේ අරමුදල්වලින් යෝජිත පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, ඒ සඳහා රුපියල් මිලියන 51ක පමණ මුදලක් ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව, එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සබරගමු පළාත් සභාව සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය අතර ගිවිසුමකට එළඹීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය යටතේ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ විධිවිධානවලට අනුකූල වෙමින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනම නෛතික ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා 2023-03-13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු එම සංස්ථාවේ පූර්ණ අනුබද්ධ ආයතනයන් වන සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත වෙන් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රති-අපනයනය කිරීම**

ශ්‍රී ලංකාවේ කුළුබඩු මුල් ස්වරූපයෙන් අපනයනය කිරීමට වඩා අගය එකතු කළ නිෂ්පාදන ලෙස අපනයනය කිරීමෙන් වැඩි ආදායමක් ඉපයීමේ ශක්‍යතාවක් පවතී. ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා සම්පූර්ණ නව නිමැවුමක් ලෙස, ඉහළ මට්ටමේ අගය එකතු කළ නිෂ්පාදන නිපදවීමට හැකි වන පරිදි මුල් ස්වරූපයෙන් ඇතැම් කුළුබඩු වර්ග ආනයනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත ප්‍රමුඛ පෙළේ සමාගම් කිහිපයක් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එකී නිෂ්පාදකයින්හට සිය වෙළෙඳපොළ අවශ්‍යතාව පුළුල් කර ගැනීමේ අවස්ථා සලසා දීම පිණිස තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රති-අපනයනය කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදාන ආධාර යටතේ ක්‍රියාත්මක වන වර්ධනය සඳහා යහපාලනය වැඩසටහනේ සහ වෙළෙඳපොළ සංවර්ධන පහසුකම් වැඩසටහනේ කාලසීමා දීර්ඝ කිරීම**

වර්ධනය සඳහා යහපාලනය වැඩසටහන සහ වෙළෙඳපොළ සංවර්ධන පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර 2017 වර්ෂයේදී ගිවිසුමකට එළඹ ඇත. එකී වැඩසටහන් දෙක සඳහා තවත් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 42.1ක අතිරේක ප්‍රදානයක් ලබා දීමට ඕස්ට්‍රේලියානු රජය එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එම ප්‍රදානය ලබාගෙන එම ව්‍යාපෘති දෙක තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය සමඟ අනුබද්ධ විධිවිධානයන්ට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් බඩඉරිඟු ආනයනය කිරීම**

විවෘත වෙළෙඳපොළේ ප්‍රමාණවත් බඩඉරිඟු තොග නොමැති වීම හේතුවෙන් කුකුළු කෑම නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවල හිඟයක් පවතී. ඒ සඳහා තාවකාලික පියවරක් ලෙස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් බඩඉරිඟු මෙට්‍රික්ටොන් 15,000ක් ආනයනය

කිරීම සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත අවශ්‍ය බලපත්‍රය ලබා දී ඇත. ඒ අනුව, සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් ලියාපදිංචි විදේශ සැපයුම්කරුවන් වෙතින් බඩඉරිඟු මෙට්‍රික්ටොන් 15,000ක උපරිමයකට යටත්ව, ප්‍රසම්පාදනය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. යාන් ඔය ජලාශය හා වම් ඉවුර ඇළ මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වූ තෝරා ගත් පවුල් සඳහා ලබා දිය යුතු විකල්ප කුඹුරු ඉඩම් වෙනුවට වන්දි ලබා දීම**

යාන් ඔය ජලාශය ඉදිකිරීමේදී හොරොව්පතාන සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉඩම් ද වම් ඉවුර ඇළ මාර්ගය ඉදිකිරීමේදී හොරොව්පතාන, පදවිය සහ ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉඩම් ද අත්පත් කරගනු ලැබ ඇත. එලෙස ඉඩම් අහිමි වූ පවුල්වලින් කොටසකට විකල්ප කුඹුරු ඉඩම් ලබා දී ඇති අතර කුඹුරු ඉඩම් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා එම ප්‍රදේශ ආශ්‍රිතව ඉඩම් නොමැති වීම හේතුවෙන් පවරාගත් ඉඩම් හිමිකරුවන්ට කුඹුරු ඉඩම් වෙනුවට අතිරේක වන්දි මුදලක් ලබා දීමට 2023-03-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, වාරිමාර්ග අමාත්‍යතුමිය ඉදිරිපත් කළ පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී:

* යාන් ඔය ජලාශය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වූ තෝරා ගත් පවුල් සඳහා ලබා දිය යුතු විකල්ප කුඹුරු ඉඩම් වෙනුවට ලබා දීමට ප්‍රමාණවත් ඉඩම් සංවර්ධනය සඳහා නිදහස් කර ගැනීමට හැකියාවක් නොමැති බැවින්, ගොවිතැන ජීවනෝපාය නොවන හා පිට පළාත්වල පදිංචි මෙනෙක් විකල්ප වාරි ඉඩම් ලබා දී නොමැති පවුල් සඳහා ඉඩම් වෙනුවට රුපියල් මිලියන 1.8 බැගින් වන්දි මුදලක් ගෙවීම.

* වම් ඉවුර ඇළ මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වූ තෝරා ගත් පවුල් සඳහා ලබා දිය යුතු විකල්ප කුඹුරු ඉඩම් වෙනුවට ලබා දීමට ප්‍රමාණවත් ඉඩම්, සංවර්ධනය සඳහා නිදහස් කර ගැනීමට හැකියාවක් නොමැති බැවින්, අක්කර 1 1/2ක කුඹුරක් වෙනුවට රුපියල් මිලියන 1.8 බැගින් වන්දි මුදලක් ගෙවීම.

07. **විදේශ රැකියා අපේක්ෂිතයන් සඳහා යාපනය, හෝමාගම සහ අම්පාර යන ප්‍රදේශවල පුහුණු/විගමනික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම**

විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා කඩිනම් මෙන්ම ගමනාන්ත රට ඉලක්ක කර ගත් විශේෂිත පුහුණු වැඩසටහන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පවත්වනු ලබයි. දැනට දිවයින පුරා කුලී පදනමින් ලබා ගත් ගොඩනැගිලිවල අවම පහසුකම් යටතේ මෙම පුහුණු වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. එබැවින්, එතෙර රැකියාවලට යොමු වීමට අපේක්ෂා කරනු ලබන්නන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයටම අයත් වන පරිදි පුහුණු මධ්‍යස්ථාන යාපනය, හෝමාගම සහ අම්පාර යන ප්‍රදේශවල ස්ථාපිත කිරීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **නුවරඑළිය, මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්කවල තෝරාගත් වතු පාසල්වල උසස් පෙළ ළමුන් සඳහා සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

වසර දෙකක කාලයක් තුළ නුවරඑළිය, මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්කවල තෝරාගත් වතු පාසල්වල උසස් පෙළ ළමුන් සඳහා සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සලසා දීමට ඉන්දීය රජය එකඟතාව පළ කර ඇත. එකී නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබී තිබේ. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 526.20ක් වන අතර 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 310ක ප්‍රතිපාදන වෙන් වී ඇත. ඒ අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය අතර ගිවිසුමකට එළඹීම පිණිස ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලසුම සඳහා අනුමැතිය**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධාන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ජාතික ගගන නාවික සෙවීම් හා මුදවා ගැනීමේ සැලැස්ම සකස් කරනු ලැබ ඇති අතර, එය අංක 2347/02 දරන 2023-08-28 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් රෙගුලාසියක්

වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී රෙගුලාසිය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා 2023-03-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයින් සඳහා සහනයක් ලබා දීම**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දින නියමයක් නොමැතිව කල් තැබීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලු විසඳීම සඳහා කමිටුවක් පත් කිරීම යෝග්‍ය බවට මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව, එම අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර ඇති කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලැබී තිබේ. එකී කමිටුවේ නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

(i) ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන බල ප්‍රදේශයෙන් පිටත සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු කිරීම හේතුවෙන් දුෂ්කරතාවයට පත් දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයෙකු ඒ සම්බන්ධව අභියාචනය කරන්නේ නම් ආයතන ප්‍රධානීන් විසින් ඒ පිළිබඳව සලකා බලා අදාළ සේවා ස්ථානයේ දේශපාලන කාර්යයන්වල හෝ දේශපාලන ප්‍රචාරණ,

ප්‍රවර්ධන කාර්යයන්වල හෝ නිරත නොවෙමින් කටයුතු කරන බවට එම නිලධරයන්ගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අනතුරුව නිලධරයන්ගේ ස්ථිර සේවා ස්ථානයට වාර්තා කිරීමට ඉඩ සලසා දීම.

(ii) 2023-04-25 දින සිට 2023-05-08 දින තෙක් කාලය වැටුප් සහිත නිවාඩු සේ සලකමින් මූලික වැටුප ගෙවීම.

(iii) 2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර දී ඇති නිලධරයන් 2023-05-08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2023 අනුව අනිවාර්යෙන් සේවයට වාර්තා කරන ලෙස නියම කිරීම.

(iv) ඒ අනුව, දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ගේ ගැටලු විසඳීම සඳහා ඉහත කරුණු ඇතුළත්ව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කිරීම.

**12. ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභා පනත් කෙටුම්පත**

සත්‍යය සහ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීම පිණිස 2023-04-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා සහ විදේශ කටයුතු ඇමතිතුමා විසින් ලබා දෙන ලද මග පෙන්වීම් අනුව "ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභා පනත් කෙටුම්පත" සකස් කරනු ලැබ තිබේ. එකී පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ද ලැබී ඇත. පොදු මහජනතාවට සහ උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන්ට තවදුරටත් සිය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා; අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා; සහ විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සඳහා වන සංශෝධන**

බද්දට යටත් පිරිවැටුම 2024-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරකට රුපියල් මිලියන 120 සිට රුපියල් මිලියන 60 දක්වා අඩු කිරීම සඳහා 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම පිණිස 2023-10-30 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම**

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ පවතින සීමාවන් හේතුවෙන් තරගකාරී හා වේගයෙන් වෙනස් වන මූල්‍ය වෙළෙඳපොළ තුළ කටයුතු කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අපහසු වී ඇති බව හඳුනාගනු ලැබ ඇත. එබැවින්, ආයතනය සඳහා තිරසර වර්ධනයක් පවත්වාගැනීම, නව ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම සහ නව ව්‍යාපාර ආකෘතියක් ගොඩනැංවීම තුළින් බැංකුවේ මෙහෙයුම් කටයුතු තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කළ යුතුව තිබේ. ඒ අනුව, සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ඩිජිටල් සංවර්තනය සඳහා වූ ආයතනික ප්‍රතිසංස්කරණ**

ශ්‍රී ලංකාවේ ඩිජිටල් සංවර්තනය තුළ වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමටත්, එහි ප්‍රතිඵල ලබා ගැනීමටත්, පුළුල් බලතල සහිත ආයතනයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, රජයේ ඩිජිටල් සංවර්තන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා උපායමාර්ගික හා ප්‍රතිපත්තිමය නායකත්වය ලබා දීම, ආයෝජන උපදෙස් ලබා දීම සහ අධීක්ෂණය

සඳහා ඩිජිටල් සංවර්තන නියෝජිතායතනය පිහිටුවීමටත්, ජාතික කෘත්‍රිම බුද්ධි උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් සංවර්තන නියෝජිතායතනයේ කොටසක් ලෙස කෘත්‍රිම බුද්ධිය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් හැකි වන පරිදි 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනතට අවශ්‍ය සංශෝධන හඳුන්වා දිය යුතුව තිබේ. ඒ අනුව, සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **පෞද්ගලික අංශය මඟින් කීරි සම්බා සහල් වර්ගයට සමාන GR 11 සහල් වර්ගයෙන් සහල් මෙට්‍රික්ටොන් 50,000ක් ආනයනය කිරීමට අවස්ථාව ලබා දීම**

වෙළෙඳපොළේ සහල් මිල පාලනය කිරීම සඳහා ආහාර ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය පරිදි සහල් මෙට්‍රික්ටොන් 50,000ක් ආනයනය කිරීම පිණිස 2023-11-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, දේශීය වෙළෙඳපොළේ කීරි සම්බා සහල් සහ සම්බා සහල්වල මිලෙහි තරගකාරීත්වයක් ඇති කරමින්, මිලෙහි වාසිය පාරිභෝගිකයාට ලබා දීමේ අරමුණින් කීරි සම්බා සහල්වලට සමාන GR 11 සහල් මෙට්‍රික්ටොන් 50,000ක් පෞද්ගලික අංශය මඟින් ආනයනය කිරීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **දේශීය වෙළෙඳපොළේ බිත්තර මිල ස්ථායීකරණය කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද ගොවිපොළවලින් බිත්තර ආනයනය කිරීම**

දේශීය වෙළෙඳපොළේ බිත්තර මිල ස්ථායීකරණය කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් බිත්තර ඉන්දීය ගොවිපොළ වෙතින් බිත්තර ආනයනය කිරීම සඳහා 2023-08-14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් බිත්තර මිලියන 155ක් ආනයනය කර ඇති අතර, 2023-12-31 දිනට පෙර තවත් බිත්තර මිලියන 18ක ප්‍රමාණයක් ආනයනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. මේ වන විට දේශීය විවෘත වෙළෙඳපොළ තුළ බිත්තර සිල්ලර මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් පවතින බැවින්, සත්ත්ව

නිෂ්පාදනය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දැනටමත් නිර්දේශ කරනු ලැබ ඇති ඉන්දියානු ගොවිපොළවලින් තවදුරටත් බිත්තර ආනයනය කිරීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව සඳහා කාර්ය නිර්ණේය අනුදේශ සහ කාර්යසාධක බලකායක් පිහිටුවීම**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව, අදාළ රාජ්‍ය ආයතන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, නියාමන අධිකාරීන් සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රයත්නවලට සම්බන්ධකරුවන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ජාතික සම්බන්ධීකරණ කමිටුවේ පවතින ක්‍රියාවලිය විධිමත් කිරීම පිණිස එම කමිටුව සඳහා වන කාර්ය නිර්ණේය අනුදේශ කෙටුම්පත් කර ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේදී පැන නැගෙන ගැටලු සඳහා විසඳුම් සෙවීමේදී රාජ්‍ය ආයතන, මූල්‍ය ආයතන, නියාමන අධිකාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා කාර්යසාධක බලකායක් පිහිටුවීම අත්‍යවශ්‍ය බව ද හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ජාතික සම්බන්ධීකරණ කමිටුව සඳහා යෝජිත කාර්ය නිර්ණේය අනුදේශ සඳහාත්, කාර්යසාධක බලකායක් ස්ථාපිත කිරීම සඳහාත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************